**නාගොඩ ප්‍රාදේශීය සභාව - 2023**

**-----------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

නාගොඩ ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක් වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට නාගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශිය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.662,000 ක් වූ හාඩිමෙක් දොඹකරය මෝටර් රථ හා කරත්ත යටතේ ගිණුම් ගත වී නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් ගත කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | ස්ථාවර තැන්පතු සඳහා ලැබිය යුතු පොලිය හා ලද පොලිය රු.196,170 ක් වගකීම් ශේෂයක් ලෙස දක්වා තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | උඩුගම උප කාර්යාලයේ අළුත්වැඩියා වියදම් බිල්පත් සමාලෝචිත වර්ෂය තුළ සභාව වෙත ඉදිරිපත් නොවීම හා ප්‍රාදේශීය සභා මහජන පුස්තකාලය අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවිය යුතු ශේෂය වැඩියෙන් ගිණුම් ගත කිරීම නිසා පිළිවෙළින් රු.849,065 කින් හා රු.202,970 කින් ගෙවිය යුතු රජයේ ආධාර ගිණුම වැඩි වී තිබුණි. | - එම - | - එම - |
| (ඈ) | වර්ෂය තුළ දරන ලද රු.10,111,667 ක ප්‍රාග්ධන වියදම් ස්ථාවර වත්කම් යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඉ) | වීථි පහන් නඩත්තු වෙනුවෙන් 2019 වර්ෂය සඳහා සභාව වෙත ලැබිය යුතු රු.102,384 ක මුදලක් 2020 වර්ෂයේ දී ලැබී තිබූ නමුත්, එම ශේෂය 2023 වර්ෂයේදීත් ණය ගැතියෝ ලෙස දක්වා තිබුණි. | ඉදිරියේදී නිවැරදිව ගිණුම් ගත කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 10 කට අදාළ ශේෂයන් සහ ඒවාට අදාළ උපයෝගී ලේඛන හා උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.3,940,500 ක වෙනසක් පැවතිණි. | ඉදිරියේ දී නිවැරදි කරන බව. | වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතුය. |

**1.6.3 අවිනිශ්චිත ගිණුම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට පැවත එන රු.18,315 ක අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂයේ දී ද නිරවුල් නොවී පැවතුණි. | ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | දිගින් දිගටම පවතින අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.5 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.116,238,133 ක් වූ ගිණුම් විෂයයන් 06 කට අදාළ විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | නිරවුල් කිරිමට කටයුතු කරන බව. | ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

**1.7 අනුකූල නොවීම්**

**1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 104 | සභාව සතු ට්‍රැක්ටරයක පිටුපස වීදුරුව සහ රියදුරු අසුනේ දකුණු වීදුරුව බිඳී ගොස් තිබුණු අතර, මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ.104 අනුව පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති බව. | රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | දකුණු පළාත් ප්‍රධාන ලේකම්ගේ 2018 මැයි 22 දිනැති අංක SS/03/12/05 දරන චක්‍රලේඛය | වසර 05 ත් 02 ත් අතර කාලය තුළ අක්‍රීය තත්ත්වයේ පැවති පිරිවැය රු.4,211,120 ක් වූ හෑඩිමෙක් යන්ත්‍රය හා ට්‍රැක්ටර් 02 ක් අළුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි. | මිල ගණන් කැඳවා ඉදිරි කටයුතු ආරම්භ කර ඇති බව. | වාහන අළුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7.2 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලේකම්වරයා විසින් කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් රහිතව දිනකට නිවස හා කාර්යාලය අතර ගමන් කිරීම සඳහා සභාවේ වාහනය භාවිතා කර තිබුණු අතර, ඒ සඳහා ඉන්ධන වෙනුවෙන් රු.277,229 ක් ගෙවීම් කර තිබුණි. | ප්‍රවාහන පහසුකම් ලබා ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා දී ඇති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.1,103,608 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.3,220,655 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| අක්කර බදු | 1,315,000 | 561,850 | 582,269 | 379,222 | 865,000 | 1,063,469 | 1,186,032 | 399,641 |
| කඩ කුලී | 3,379,200 | 2,967,456 | 2,859,710 | 725,387 | 4,476,000 | 1,813,560 | 6,633,804 | 617,641 |
| බලපත්‍ර ගාස්තු | 1,100,500 | 1,086,328 | 982,805 | 103,523 | 551,000 | 965,740 | 1,696,452 | - |
| වෙනත් ආදායම් | 1,705,000 | 830,496 | 830,496 | 14,801,129 | 1,710,000 | 780,242 | 1,191,152 | 14,801,129 |
| | 7,499,700 | 5,446,130 | 5,255,280 | 16,009,261 | 7,602,000 | 4,623,011 | 10,707,440 | 15,818,411 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට හිඟ මුළු ආදායම රු.15,818,411 ක් වූ අතර වර්ෂ අවසානයට හිඟය රු.16,009,261 ක් වීමෙන්, ආදායම් රැස් කිරීමේ ප්‍රතිශතය සියයට 24 ක් විය. | මෙම හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ආ) | ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ හෙක්ටයාර් 17,971 ක වර්ග ප්‍රමාණයකින් යුතු ග්‍රාම සේවා වසම් 53 ක් පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) හා (2) වගන්ති ප්‍රකාරව එහි දියුණු කළ ප්‍රදේශ හඳුනාගෙන වරිපනම් බදු අයකර සභාවේ ආදායම් ඉහල නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ග්‍රාම සේවා වසම් 06 ක් හඳුනාගෙන ගැසට් කර ඇති බව. | වරිපනම් බදු පැනවිය යුතු ප්‍රදේශ හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | කඩ කුලී හිඟ ශේෂය තුළ පැවති රු.358,784 ක ශේෂ 02 ක් වසර 03 ක කාලයක සිට අය නොවී පැවතුණි. | මේ පිළිබඳව විසඳුමක් ලබා දීමට කටයුතු කරන බව. | අය නොවී පවතින ශේෂ කඩිනමින් අය කර ගත යුතුය. |
| (ඈ) | සභාව සතු ජල බවුසරය මඟින් ජලය බෙදා හැරීම සඳහා දින 84 ක් භාවිතා කර තිබූ නමුත්, දින 07 ක් සඳහා පමණක් ආදායම් අයකර ගෙන තිබීමෙන් සභාවට රු.770,000 ක ආදායමක් අහිමි වී තිබුණි. | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ පොදු උපයෝගීතා සේවා යටතේ 105(අ) අනුව ඉහත ජල බවුසරය ලබා දීම සිදුකර ඇති බව. | නියමිත පරිදි ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | සභා සීමාව තුළ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 27 කින් අය කළයුතු රු.783,200 ක ආදායම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව. | අදාළ ගාස්තු අය කර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකායර්ක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් ජල විදුලි බිල්පත් නියමිත කාල වකවානු තුළ ගෙවීම් නොකිරීම නිසා ශේෂය හා දඩය ලෙස රු.43,425 ක් ගෙවීමට සභාවට සිදු වී තිබුණි. | මෙය ඉදිරියේ දී නැවත සිදු නොවීම සඳහා කටයුතු කරන බව. | ජල, විදුලි බිල්පත් අප්‍රමාදව ගෙවිය යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රදේශය තුළ ස්ථාපිත කර තිබූ සන්නිවේදන කුළුණු 08 ක් සඳහා පෙරසරි ගාස්තු රු.240,000 ක් අය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ ගාස්තු අය කළ යුතුය. |
| (ආ) | ප්‍රදේශය තුළ පිහිටි සන්නිවේදන කුළුණු 03 කට අදාළව බලපත්‍ර ගාස්තු 2019 හා 2022 වර්ෂයේ සිට ගෙවා නොතිබූ නමුත්, ඒ සඳහා අයකළ යුතු රු.33,000 ක් අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂය සඳහා මුදල් ගෙවන ලෙස දන්වා ලිපි යොමුකර ඇති බව. | ව්‍යාපාර හා වෘත්තීය බලපත්‍ර ගාස්තු අය කළ යුතුය. |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරයට අදාළ පිවිසුම් මාර්ගය ඉදිකිරීමේ දී පස් කැපීමට අදාළ මිල අනුපාත යටතේ ප්‍රමාණය පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කිරීමකින් තොරව රු.1,270,225 ක් අවිධිමත් ලෙස ගෙවීම් කර තිබුණි. | යන්ත්‍ර පැය පදනම මත ගෙවීම් කළ බව. | ප්‍රමාණය පදනම් කරගෙන ඇස්තමේන්තු සකස් කර ගෙවීම් කළ යුතුය. |
| (ආ) | තල්ගස්වල පිහිටි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු සකස් කිරීමේ දී වැඩ විෂය 5.1 යටතේ ගොඩනැගිල්ලේ අත්තිවාරම් පිරවීම සඳහා නියමිත මිල අනුපාත භාවිතා නොකිරීම නිසා රු.181,472 ක් වැඩිපුර ගෙවා තිබුණි. එසේම ගිවිසුම්ගත වටිනාකම රු.8,503,932 ක් වූ මෙම කර්මාන්තයේ 2021 දෙසැම්බර් 09 දිනට වැඩ නිම කිරීමට නියමිතව තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසානයට නිම කළ වැඩ ප්‍රමාණය රු.2,989,854 ක් වීමෙන් එහි මූල්‍ය ප්‍රගතිය 35 ක් තරම් අඩු අගයක් විය. | මාර්ගයේ සහ ආදාහනාගාර ගෙපලේ පස් එහි ඉදිකිරීම් සඳහා අවශ්‍ය වූ බැවින් එම පස් තල්ගස්වල වෙළඳ සංකීර්ණයේ ඉදිකිරීම් වලට යොදා ගැනීමට ප්‍රමාණවත් නොවූ බව හා වැඩ නිම කිරීමට ව්‍යාපෘතිය සිදු කරන අවස්ථාවේ දී ඉතාමත් අයහපත් කාලගුණික තත්ත්වයක් පැවති බව. | නියමිත මිල අනුපාත අනුව භාවිතා කළ යුතුය.<br><br>අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට නියමිත කාලය තුළ ඉදිකිරීම් අවසන් කළ යුතුය. |

**3.4 සේවක ණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සේවයෙන් ඉවත් වූ හා විශ්‍රාම ගිය නිලධාරීන් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.39,847 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ණය ශේෂ අයකර ගැනීමේ හැකියාව සම්බන්ධව තවදුරටත් සලකා බලන බව. | අය වියයුතු හිඟ ණය ශේෂ අයකර ගත යුතුය. |